**මොනරාගල ප්‍රාදේශීය සභාව**
**මොනරාගල දිස්ත්‍රික්කය**
**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 23 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 29 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මොනරාගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දරන ලද රු. 294,900 ක ප්‍රාග්ධන වියදම් අයහාර වියදම් ලෙසට ගිණුම්ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | 2020 වර්ෂයේ මිලදී ගනු ලබන ස්ථාවර වත්කම් ප්‍රාග්ධන වියදම් ලෙසට ගිණුම්ගත කරන බව දන්වමි. |
| (ii) | ඉකුත් වර්ෂ වෙනුවෙන් දරන ලද රු. 123,017 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙසට ගිණුම්ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදිව ගිණුම්ගත කරන බව දන්වමි. |
| (iii) | පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කරගත යුතු ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියේ සහභාගීත්ව සංවර්ධන සැලැස්ම සකස් කිරීමට දරන ලද රු. 97,111 ක් ලැබිය යුතු මුදල් ලෙසට ගිණුම්ගතකර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදී ලැබිය යුතු මුදල් ලෙසට නිවැරදිව ගිණුම්ගත කරන බව දන්වමි. |

**(ආ)** **විගණනය සඳහා සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රු. 925,952,768 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් තක්සේරු වාර්තා විගණනයට ඉදිරිපත්කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉඩම් පිළිබඳ අවශ්‍ය තොරතුරු තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර ඇති බවද, ඉන් තක්සේරු වාර්තා 6ක් ලැබී ඇති අතර ඉතිරි ඉඩම්වලට අදාල තක්සේරු වාර්තා මෙතෙක් ලැබී නොමැති බව දන්වමි. |

**1.4** **අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| **(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | | | |
| 139 වගන්තිය | වරිපනම් බදු අයකළ හැකි සීමාව තුළ පිහිටි බදු අයකළ හැකි සියළුම දේපල හඳුනාගෙන තක්සේරු කිරීමේ කාර්යය සඳහා වූ වාර වාර්තා ලබාගෙන නොතිබුණි. | තක්සේරු කිරීමේ කාර්යය සඳහා වූ වාර වාර්තා ලබාගත යුතුවේ. | 2020 වර්ෂයේදී තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය දත්ත ඇතුළත් කර තොරතුරු පත්‍රිකාව සකස් කර ඇති බවද, වසංගත තත්ත්වය අවසන් වූ වහාම එම කටයුතු ආරම්භ කරන ලෙසට, ආදායම් පරීක්ෂකවරුන්ට උපදෙස් ලබාදී ඇති බව දන්වමි. |

(ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය**

| | | | |
|---|---|---|---|
| XXIV පරිච්ඡේදයේ 4 වගන්තිය | වර්ෂ 15 කට අධික කාලයක සිට පැවත එන සභාවේ සේවය කළ සේවකයින් 06 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 246,759 ක සේවක ණය අයකර නොතිබුණි. | හිඟ සේවක ණය අයකර ගතයුතුවේ. | ලිපිගොනු හා ඇපකරුවන් පිළිබඳ තොරතුරු සොයා ගැනීමට ලේඛන නොමැති බැවින් මේ සම්බන්ධව තීරණයක් ගැනීමට නොහැකි වී ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 18,842,362 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 13,289,271ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්පත් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | | ඇස්තමේන්තු ගත ආදායම රු. | බිල් කළ ආදායම රු. | රැස්කළ ආදායම රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. | ඇස්තමේන්තු ගත ආදායම රු. | බිල් කළ ආදායම රු. | රැස්කළ ආදායම රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. |
| (i) | වරිපනම් හා බදු | 12,985,000 | 12,411,917 | 6,341,709 | 6,070,208 | 12,869,609 | 11,970,956 | 6,227,817 | 5,743,139 |
| (ii) | කුලී | 20,445,140 | 2,982,950 | 2,982,950 | - | 12,583,950 | 2,610,077 | 2,608,135 | 1,942 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,335,100 | - | 1,612,878 | - | 1,045,100 | 1,353,900 | 1,359,900 | - |
| (iv) | වෙනත් ආදායම් | 22,292,500 | 32,710,844 | 27,097,688 | 5,613,156 | 1,089,000 | - | 20,405,302 | - |
| එකතුව | | 51,057,740 | 48,105,711 | 38,035,225 | 11,683,364 | 27,587,659 | 15,934,933 | 30,601,154 | 5,745,081 |

**2.2.2** <u>වරිපනම් හා බදු</u>

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට බිල් කරන ලද රු.12,411,917 ක් වූ වරිපනම් බදු ආදායමින් දෙසැම්බර් 31 දිනට රු. 6,309,190 ක් රැස්කර නොතිබුණු අතර එය මුළු බිල් කළ වටිනාකමින් සියයට 51 ක් විය. | හිඟ වරිපනම් අයකරගත යුතුවේ. | වසංගත තත්ත්වය මත 2020 මැයි 31 තෙක් වරිපනම් බදු අයනොකරන ලෙස දැනුම්දී ඇති බැවින් ඉදිරියේදී සැලසුම් සකස්කර මුදල් අයකිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු. 16,567,232ක් වූ හිඟ වරිපනම් බදු ආදායමින් වර්ෂය තුලදී රු. 10,221,375ක් අයකරගෙන නොතිබුණි. එම අය නොකළ මුදල වර්ෂය ආරම්භයේ පැවති හිඟ ශේෂයෙන් සියයට 62 ක් විය. | හිඟ වරිපනම් අයකරගත යුතුවේ. | මෙම මුදල් අයකිරීමට විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කළ බවද නිලධාරීන් වෙත හිඟ අයකිරීමට උපදෙස් දුන් බව දන්වමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.10,000ට වැඩි වරිපනම් බදු ඒකක 146 කින් අයවිය යුතු හිඟ මුදල රු.3,378,476 ක් විය. | හිඟ වරිපනම් අයකරගත යුතුවේ. | 2020 මාර්තු 30 වන විට වරිපනම් ඒකක 41 කින් රු. 452,988 ක් අයකර ඇති බවද, ඉතිරි මුදල් අයකර ගැනීමට ආදායම් පරීක්ෂකවරුන්ට උපදෙස් දුන් බව දන්වමි. |

**2.2.3** <u>**දේපොළ බදු ආදායම්**</u>

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සභාවට අයත් දේපළ 5 කින් අයවිය යුතු රු.591,650 ක් අයකර නොතිබුණි. | හිඟ බදු මුදල් අයකරගත යුතුවේ. | 2020 මැයි 20 දිනට රු. 77,112 ක් අයකර ඇති බවද, බදු නොගෙවන දේපල සඳහා නීතිමය ක්‍රියා මාර්ගයන් ගෙන ඇති බව දන්වමි. |

**2.2.4** කඩ කාමර කුලී ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් කඩ කාමර 153 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු කඩ කාමර කුලී රු.1,433,325 ක් අයකර නොතිබුණි. | හිඟ කුලී අයකරගත යුතුවේ. | 2020 මැයි 20 දිනට රු. 869,058 ක් අයකර ඇති බවද, ඉතිරි මුදල කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

**2.2.5** ජල ගාස්තු ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අයවිය යුතු රු. 616,450 ක් වූ ජල ගාස්තු අයකර නොතිබුණි. | හිඟ ජල ගාස්තු අයකගත යුතුවේ. | 2020 මාර්තු 13 දිනට රු. 99,100 ක් අයකර ඇති බව දන්වමි. |

**2.2.6** වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂ 1 කට වඩා වැඩි කාලයක සිට පැවත එන හඳුනා නොගත් හිඟහිටි වෙනත් ආදායම් රු. 5,260,292 ක් සමාලෝචිත වර්ෂයේදීද අයකර නොතිබුණි. | හිඟ මුදල් කඩිනමින් අයකරගත යුතුවේ. | නිශ්චිත උපලේඛන නොමැති බැවින් ගිණුම්වලින් කපා හැරීමට නොහැකිවී ඇති බවද, විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරිපත්කර විසඳුමක් ලබා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

**2.2.7** උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති හිඟ උසාවි දඩ රු. 691,125 | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු | 2020 අප්‍රේල් 16 දිනට රු. 596,793 ක |

| | | |
|---|---|---|
| ක් හා හිඟ මුද්දර ගාස්තු රු.26,431,308 ක් අයකර නොතිබුණි. | අයකරගත යුතුවේ. | උසාවි දඩ සහ රු. 7,031,516 ක මුද්දර ගාස්තු ලැබී ඇති බවද, ඉතිරි මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

**2.3** <u>අධිභාර</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------------- | -------------- | -------------------- |
| ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව ඉකුත් වර්ෂයන් තුළදී පනවන ලද අධිභාර සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 422,730 ක මුදලක් අයකර නොතිබුණි. | අදාල පාර්ශවයන්ගෙන් අධිභාර අයකර ගත යුතුවේ. | රු. 291,600 ක අධිභාරයට අදාල නඩුව අනුව අදාල පුද්ගලයින් සිර දඬුවම් විඳීම හේතුවෙන් අධිභාරයෙන් නිදහස් කර දෙන ලෙස නැවත නඩු ගොනුකර ඇත. නඩු වාර්තාව ලැබුණු පසු ඉදිරි කටයුතු කරන බවද සඳහන් කරමි.<br><br>රු.155,080 ක අධිභාරයෙන් මේ වන විට රු. 25,500 ක් අයකරගෙන ඇති අතර එම පුද්ගලයින් දෙදෙනාම මිය ගොස් ඇති බැවින් ඒ දෙදෙනාගේ මරණ සහතික පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත යවා ඇත.<br><br>රු. 35,900 ක අධිභාරයෙන් අයවීමට ඉතිරිව තිබුණු රු. 1,550 ක මුදල ගෙවා ඇත. |

**3.** <u>මෙහෙයුම් සමාලෝචනය</u>

**3.1** <u>කාර්ය සාධනය</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

<u>තිරසර සංවර්ධනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව එක්සත් ජාතීන්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව දැනුවත්වී තිබුණද, සභාවට අදාල කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | නිශ්චිත ක්‍රමවේද අනුව දර්ශක හඳුනා ගැනීමට කටයුතු කර නොමැති වුවද ප්‍රායෝගික තත්ත්වයේ ක්‍රියාකාරකම් සඳහා දර්ශක හා නිර්නායක හඳුනාගෙන ඇති බව දන්වමි. |

**3.2** <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | <u>පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගැනීම</u> | | |
| | සභාව විසින් ලබාදී තිබුණු පාරිසරික ආරක්ෂණ බලපත්‍ර 30 ක වලංගු කාලය ඉකුත්වී තිබුණද එම බලපත්‍ර අලුත්කිරීමට කටයුතුකර නොතිබුණු බැවින් සභා අරමුදලට එක් බලපත්‍රයකට රු. 4,000 බැගින් රු. 120,000 ක මුළු ආදායමක් අහිමිවී තිබුණි. | මෙම ව්‍යාපාර පරීක්ෂා කර නියමිත ගාස්තු අයකර පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාදිය යුතුවේ. | පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අලුත්කර නොමැති කර්මාන්ත පිළිබඳ අවශ්‍ය කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | සභාව විසින් පවත්වා තිබුණු වීථි පහන් ලේඛනය අනුව, සභා බලප්‍රදේශයේ වීථි පහන් 1555 ක් සවිකර තිබුණද, විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති චක්‍රලේඛය පරිදි වීථි ආලෝකකරණය සම්බන්ධයෙන් ලංකා විදුලි බල මණ්ඩලය සමඟ ගිවිසුම්ගතවී නොතිබුණි. මේ හේතුවෙන් සභාවට අයකරගත හැකි ගාස්තු අයකර ගැනීමට නොහැකිවී තිබුණි. | විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම්ගත විය යුතුවේ. | මහජන අවශ්‍යතාවයන් සැලකිල්ලට ගෙන ලංකා විදුලිබල මණ්ඩලයේ උපදෙස් අනුව ඉදිරි කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | 2000 සිට 2018 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ සභාවට ලැබී තිබුණු වාහන/යන්ත්‍ර 4 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගෙන නොතිබුණි. | නීත්‍යානුකූල අයිතිය පවරාගැනීමට කටයුතු කළ යුතුවේ. | ගිනි නිවන රථයක ලියකියවිලි නොමැති අතර එක් ගලි රථයක් ව්‍යාපෘතියක් යටතේ ලැබී ඇති බැවින් එය පවරාගත නොහැක. ට්‍රක් රථයක වැසි අංකයේ වෙනසක් පවතින අතර එය |

| | | | |
|---|---|---|---|
| | | | ඉදිරියේදී පවරා ගැනීමට කටයුතු කරන අතර එක් ගලි රථයක් පවරා ගැනීමේ කටයුතු කරමින් පවතින බව දන්වමි. |
| (ඇ) | වරිපනම් බදු අය කිරීමට සුදුසු ප්‍රදේශ ලෙස 1979 වර්ෂයේදී මුල්වරට හඳුනාගෙන නැවත 2019 වර්ෂයේ දියුණු කළ ප්‍රදේශ වරිපනම් බදු අය කළ හැකි ප්‍රදේශ පුළුල්කර ගෙන නොතිබුණි. | කලින් කළ දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අයකළ හැකි ප්‍රදේශ පුළුල් කරගත යුතුවේ. | හඳුනාගෙන ඇති ප්‍රදේශ සම්බන්ධයෙන් විරෝධතා මතු වූ බැවින් විෂයභාර අමාත්‍යවරයාගේ උපදෙස් අනුව ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |

**3.3** <u>මානව සම්පත් කළමනාකරණය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තනතුරු 2 කට අදාලව සේවකයන් 9 දෙනෙකුගේ අතිරික්ත හා තනතුරු 12 කට අදාලව පුරප්පාඩු 19 ක් පැවතුණි. | අතිරික්ත තනතුරු අනුමත කර ගත යුතු අතර පුරප්පාඩු පුරවා ගත යුතුවේ. | මාසික කාර්ය මණ්ඩල වාර්තාව මගින් පළාත් පාලන දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇති බව දන්වමි. |

**3.4** <u>වත්කම් කළමනාකරණය</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් එකතුව අක්කර 107 ක් වූ ඉඩම් කැබලි 68 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතුකර නොතිබුණු අතර ඉඩම් කැබලි 56 ක මැනුම් කටයුතුද කර නොතිබුණි. | සභාවට අයත් ඉඩම්වල මැනුම් කටයුතු කර නීත්‍යානුකූල අයිතිය පවරා ගත යුතුවේ. | මිනින්දෝරු සැලසුම් ලැබීමෙන් පසු නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | අවසන්වරට 2009 වර්ෂයේදී යාවත්කාලීන කර තිබුණු මාර්ග ඉන්වෙන්ට්‍රිය අනුව මාර්ග 334 ක් පැවති අතර 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය අනුව එම මාර්ග ගැසට් පත්‍රයේ පළ කිරීමට කටයුතුකර නොතිබුණි. | මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීනකර ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීමට කටයුතු කළ යුතුවේ. | මාර්ග 27 ක පිඹුරු පත් සකස්කර ඇති අතර භාෂා පරිවර්තන ලැබුණු පසු ගැසට් කරන බව දන්වමි. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුවේ. | අභ්‍යන්තර විගණන වාර්තාවක් නිකුත් කිරීම සම්බන්ධයෙන් පුහුණුවක් ලබා නොමැති බැවින් වාර්තාවක් නිකුත් නොකළ බව දන්වමි. |

### 4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි. | සඳහන් කර ඇති නෛතික ප්‍රතිපාදන අනුව විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | එක් කමිටුවක් පවත්වා ඇති බවද ඉදිරියේදී චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරන බව දන්වමි. |